**ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතිය - 2017**

---

ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ප්‍රථම ගිණුම්කරණ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා Agence Francaise De Development (AFD) අතර අංක 101104 එල් සහ 2015 ඔක්තෝබර් 02 දිනැති ඒඑෆ්ඩී ණය ගිවිසුමේ 11.5 වගන්තිය සහ අංක සීඑල්කේ 101104 එල් සහ 2016 නොවැම්බර් 18 දිනැති සංශෝධිත ණය ගිවිසුමේ 3.4.3 (ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලිබල පද්ධතියේ අවශෝෂණ ධාරිතාව වැඩි කිරීම සහ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම මගින් ජාතික විදුලිබල පද්ධතිය සඳහා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙම ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො. මිලියන 46.40 ක් (යූරෝ මිලියන 41.10 ක්) වන අතර එය රු. මිලියන 6,660.10 කට සමාන වේ. එයින් ඇ.ඩො. මිලියන 33.9 ක් (යූරෝ මිලියන 30.0 ක්), රු. මිලියන 4,865.90 කට සමාන වන මුදලක් මූල්‍යයනය කිරීමට Agence Francaise De Development (AFD) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සිවිල් ඉදිකිරීම් කටයුතු 2018 ජනවාරි 06 දින ආරම්භ කරන ලද අතර 2020 ජනවාරි 05 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය මගින් පවත්වා ගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය ආදියෙන් සිදු කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව ණය යටතේ ආපසු ගැනීම් සිදු කර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ,

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මා වෙත සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය මගින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය

සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේ ද යන බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා 2018 දෙසැම්බර් 05 වන දින ඉදිරිපත් කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2016 වසරේ මූලික සමීක්ෂණය, ගබඩා ඉදි කිරීම සහ පාංශු පරීක්ෂාව යන අරමුණු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් වැය කරන ලද රු. මිලියන 67.10 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල උපදේශන ගාස්තු යටතේ දක්වා තිබුණු අතර 2016 වසරේ ලංකා විදුලිබල මණ්ඩලය මගින් වැය කරන ලද රු. මිලියන 98.3 ක් වූ මූලික වියදම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුළත් කරන ලද අයවැයගත ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2017** දෙසැම්බර් **31** දිනට | |
| | ඇ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු.මිලියන |
| AFD | 33.90 | 4,865.90 | 1,306.00 | 5.43 | 820.90 | 5.43 | 820.90 |
| ශ්‍රී ලං ර | 12.50 | 1,794.20 | - | - | - | - | - |
| ලංවිම | - | - | 225.00 | 1.25 | 178.70 | 1.81 | 274.10 |
| එකතුව | **46.40** | **6,660.10** | **1,531.00** | **6.68** | **999.60** | **7.24** | **1,095.00** |

### 3.2 භෞතික ප්‍රගතිය

මුල් ණය ගිවිසුම 2015 ඔක්තෝබර් 02 දින අත්සන් කරනු ලැබුවද, ලංකා විදුලිබල මණ්ඩලය මගින් වෙන් කරන ලද අරමුදලින් මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණේ 2016 අප්‍රේල් 01 දිනය. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට අනුව, මාලිබොඩ, නාවලපිටිය, රාගල සහ වෙවැල්වත්ත යන විදුලි උපපොළවල සහ අදාළ විදුලි සම්ප්‍රේෂණ මාර්ගවල ඉදි කිරීමේ කටයුතු 2019 සැප්තැම්බර් 30 දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද, 2018 ජනවාරි 06 වන දින එම කටයුතු ආරම්භ කරන ලද අතර 2020 ජනවාරි 06 දින එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කරන ලදී. ලැබී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ද අදාළ විදුලි උපපොළවල සහ සම්ප්‍රේෂණ මාර්ගවල ඉදි කිරීමේ කටයුතුවල කැපී පෙනෙන භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

මූල්‍ය රෙගුලාසි 134 (3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දක්වා ඇති අවශ්‍යතාවට අනුකූල වන පරිදි, ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය වී නොතිබුණි.